**ද්වීතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන - 2024**

---

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ද්වීතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන් වියදම් ප්‍රකාශනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2020 දෙසැම්බර් 01 දින අත්සන් කරන ලද අංක 4021- SRI දරන ණය ගිවිසුම ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළයුතු යැයි මා විසින් අදහස් කරනු ලබන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය ගිවිසුම අනුව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු නවයක් වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. රට තුළ ද්වීතීයික අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කිරීම, ද්වීතීයික විද්‍යාව, තාක්ෂණය, ගණිතය සහ වාණිජ්‍යය (STMC) වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩිදියුණු කිරීම, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සහා පාසල්වල ධාරිතාව ශක්තිමත් කිරීම සහ ආංශික කළමනාකරණ ධාරිතාව ශක්තිමත් කිරීම මෙම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 608,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 3,200ක් වන අතර එයින් රු. මිලියන 76,000කට සමාන එ.ජ.ඩො. මිලියන 608,000 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යායනය කිරීමට එකඟ විය. ඉතිරි රු. මිලියන 532,000 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මුල්‍යායනය කිරීමට අපේක්ෂා කෙරේ.
2020 දෙසැම්බර් 08 දින මෙම වැඩසටහනේ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇති අතර 2025 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහවලින් සමන්විත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන් වියදම් ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් ගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම්, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් යන කොටස් තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය භාර පාර්ශවයන්ගේ වගකීම්**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන් වියදම් ප්‍රකාශනය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව පාලනය භාර පාර්ශවයන් විසින් වගකිව යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන් වියදම් ප්‍රකාශනය, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන් වියදම් ප්‍රකාශනය පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.
මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන් වියදම් ප්‍රකාශනයේ ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන් වියදම් ප්‍රකාශනයේ ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු 09 සඳහා ඒකාබද්ධ වැඩසටහන් වියදම් ප්‍රකාශනයේ සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී මා විසින් හඳුනාගන්නා ලද වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික ප්‍රගතිය

### 2.1 වැඩසටහන් ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2024 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගත් කාර්යසාධනය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම | වැඩසටහන් 304 | වැඩසටහන් 163 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩසටහන් 304ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, වැඩසටහන් 163ක් පමණක් පවත්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී පළාත් වැඩසටහන් සම්බන්ධීකාරකවරුන්ගේ අකාර්යක්ෂමතාවය මේ සඳහා හේතු විය. | අදහස් දක්වා නොතිබුණි. | සැලසුම් කළ පරිදි අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගත යුතුය. |
| (ආ) | ගුරු පුහුණුව | ගුරුවරුන් 53,839 | ගුරුවරුන් 12,493 | 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, සබරගමුව පළාතේ ගුරුවරුන් 53,839 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට ගුරුවරුන් 12,493 දෙනෙකු පමණක් පුහුණුව ලබා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී පළාත් වැඩසටහන් සම්බන්ධීකාරකවරුන්ගේ අකාර්යක්ෂමතාවය මේ සඳහා හේතු විය. | අදහස් දක්වා නොතිබුණි. | සැලසුම් කළ පරිදි අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගත යුතුය. |

## 2.2 අක්‍රිය/ භාවිතා නොකළ/ ඌන උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාතේ වැඩසටහන් 07 කට අදාළව රු. 687,017 ක වියදමක් දරා තිබුණද, එම වැඩසටහන් සඳහා කිසිදු අයෙකු සහභාගී වී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | පුහුණු වැඩසටහන් සඳහා ගුරුවරුන් ආකර්ෂණය කරගැනීමට පළාත් වැඩසටහන් සම්බන්ධීකාරකගේ අධීක්ෂණය යටතේ වැඩසටහනක් සකස් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් පාසල් සඳහා ලබා දී ඇති මුළු ප්‍රදානවලින් රු. 61,140,991 ක් පළාත් අටක පාසල් සංවර්ධන ගිණුම්වල නිෂ්ක්‍රිය තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ප්‍රගති සමාලෝචනය සිදුකර කාර්යසාධනය ළඟා කරගැනීම පිළිබඳව තහවුරු කළ යුතුය. |
| (ඇ) | 2024 වර්ෂය සඳහා උප-විසර්ජන සබැඳි දර්ශක (SDLI) 32ක් සඳහා එකතුව එ.ජ.ඩො. මිලියන 161.33 ක මුදලක් වෙන්කර තිබුණද, විසර්ජන සබැඳි දර්ශක (DLI) ළඟාකර නොගැනීම හේතුවෙන් එය එ.ජ.ඩො. මිලියන 56.10 දක්වා සියයට 34.77 කින් අඩුකර තිබුණි. | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුමත නොකිරීම හේතුවෙන් 2023 වර්ෂය සඳහා ඉලක්කගත කිසිදු විසර්ජන සබැඳි දර්ශකයක් (DLI) ළඟාකරගැනීමට නොහැකි විය. | ලබාදී ඇති කාලසීමාව තුළ විසර්ජන සබැඳි දර්ශකයන් (DLI) ළඟාකරගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා එ.ජ.ඩො. මිලියන 400 ක මුළු ණය මුදලක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය දක්වා එ.ජ.ඩො. මිලියන 254.20 ක් පමණක් භාවිතා කර තිබුණු අතර එය මුළු ණය මුදලින් සියයට 63 ක් විය. | 2023 වර්ෂයේදී ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති රාමුව තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් ඉතිරි ඉලක්ක ළඟාකරගැනීමේ ඌනතාවයක් පවතී. | සැලසුම් කළ පරිදි අපේක්ෂිත කාර්යසාධනය ළඟා කරගත යුතුය. |

## 2.3 මතභේදාත්මක ස්වරූපයේ කරුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂය සඳහා බස්නාහිර පළාත තුළ හවුල්කාරිත්ව ගිවිසුම ක්‍රියාත්මක කිරීමට එකතුව රු. 15,000,000 ක ප්‍රතිපාදන අනුමත කර ඇති අතර විසර්ජන සබැඳි දර්ශක (DLI) ඉලක්ක වැඩසටහන් සඳහා රු. 14,238,000 ක් | අදහස් දක්වා නොතිබුණි. | වැඩසටහනට අදාළ සියලුම ගෙවීම් සම්බන්ධ දර්ශක ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැය කර ඇත. කෙසේවෙතත්, වාර්ෂික විසර්ජන සබැඳි දර්ශක (DLI) ඉලක්කවල සඳහන් කර ඇති විසර්ජන සබැඳි දර්ශක (DLI) 05 යටතේ විදුහල්පතිවරුන්/ නියෝජ්‍ය විදුහල්පතිවරුන්/ සහකාර විදුහල්පතිවරුන් පුහුණු කිරීමේ කිසිඳු වැඩසටහනක් ඇතුළත් කර නොතිබුණි. | | |
| (ආ) | භාණ්ඩාගාර ලේකම් විසින් සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමු කරන ලද 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 හි (II) ඡේදයේ සඳහන් පරිදි කාර්ය මණ්ඩලය සඳහා ගෙවිය යුතු දීමනා ගෙවීමේදී භාණ්ඩාගාර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන කටයුතු කිරීම වළක්වා ගත යුතු වේ. කෙසේවෙතත්, ඌව පළාත් සභාවේ තනතුරු 07ක් යටතේ රු. 2,189,269 ක් වූ දීමනා ගෙවා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | උප විසර්ජන සබැඳි දර්ශක 40 සහ 43 සම්බන්ධයෙන් පාසල් සංවර්ධන වැඩසටහනේ (SDP) භාවිතා කරන ලද එක් උපායමාර්ගයක් වන්නේ 2022, 2023 හා 2024 වර්ෂවලදී පිරිමි ළමයින් පාසල් හැරයාමේ අනුපාතය සියයට 20 සිට සියයට 40 දක්වා අඩු කිරීමයි. පළාත් පාසල්වල නිරීක්ෂණයන් අනුව තෙවන පාර්ශවයන් විසින් සපයන ලද වාර්තා මත පදනම් වූ තොරතුරු යාවත්කාලීන නොවන අතර යාවත්කාලීන කරන ලද තොරතුරු වැඩසටහන් කළමනාකරණ ඒකකය තුළ නොතිබුණි. ඒ අනුව, තෙවන පාර්ශවය විසින් ලබාගත් වාර්තා ප්‍රතිඵල මත නොව, දත්ත මත පමණක් පදනම් වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, 2024 වර්ෂයේදී ඉහත විසර්ජන සබැඳි දර්ශක (DLI) සඳහා තෙවන පාර්ශවීය සත්‍යාපන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ආමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දී ඇති කාලසීමාව තුළදී විසර්ජන සබැඳි දර්ශක (DLI) ඉලක්ක ඉටුකරගැනීමට සැලසුම් කළ යුතුය. |

**2.4 පද්ධති හා පාලනයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත තුළ උසස් පෙළ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා ජීව විද්‍යාව වැනි විෂයයන් 13 ක සාක්ෂරතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් රු. 2,000,000 ක ප්‍රතිපාදන | අදහස් දක්වා නොතිබුණි. | අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | වෙන්කර තිබුණද, එම විෂයයන් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ලබාදී නොතිබුණි. | | යුතුය. |
| (ආ) | 2018 ජූලි 24 දිනැති අංක 06/2018 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති ඌව පළාතේ ගුණාත්මක අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ගෝපදේශවල 03 වන ඡේදය අනුව, අයදුම්පත් කැඳවීමෙන් හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු සම්පත්දායකයින් තෝරාගෙන ලියාපදිංචි කර පුහුණු සංචිතයක් ස්ථාපිත කිරීම තුළින් පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් තෝරාගත යුතුය. කෙසේවෙතත්, විගණිත දිනය වූ 2025 ජූලි 24 දින වනවිටත් ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් එම විධිවිධානවලට අනුව සම්පත්දායකයින් ලියාපදංචි කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛයට අනුව සම්පත්දායකයින් බඳවාගැනීමට හා පුහුණු වැඩසටහන් කාර්යක්ෂම ලෙස සංවිධානය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විසර්ජන සබැඳි දර්ශක 04 ට අදාළව සමස්ත අධ්‍යාපන පද්ධතිය තුළ සිදුකළ යුතු ගුරුවරුන් සේවයේ යෙදවීම පිළිබඳ අවධානය යොමු නොවීම හා පළාත් 9 ඇතුළුව සමස්ත පාසල් පද්ධතියටම අදාළ වන මෙම ගුරු තුලනය පිළිබඳ යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට අපොහොසත්වීම හේතුවෙන්, මෙම ඉලක්කය සපුරා ගැනීම ගැටළු සහගත බව විගණනයේදී නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | ගුරු තොරතුරු අඩංගු කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර විෂයයන් අනුව යාවත්කාලීන කළයුතු අතර ගුරු ඇගයීම නිසි පරිදි සිදුකළ යුතුය. |
| (ඈ) | මධ්‍යම පළාතේ අධ්‍යාපන කාර්යාල 15 ක් පවතින අතර පළාත් හරහා අදාළ විෂයයන් සංවර්ධනය කිරීම සඳහා හඳුනාගත් නිර්ණායක හා මූලික ක්‍රමවේදයන් එම පළාතේ ක්‍රියාත්මක කර නොතිබුණි. එමනිසා, පළාතේ පවතින ජාතික හා පළාත් පාසල් සංඛ්‍යාව, පළාත්වල පවතින දුෂ්කරතා, පළාත් පාසල්වල පවතින ගුරු හිඟය සහ පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ පාසල් හැරයාම වැනි කරුණු කෙරෙහි අවධානය යොමුකර, සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ ඵලදායී සහ ප්‍රශස්ත මට්ටමේ ඉලක්ක සඳහා SESIP යටතේ සිදුකෙරෙන ප්‍රදානයන් භාවිතා කිරීම පිළිබඳ ප්‍රමාණාත්මක අධීක්ෂණයක් හා මඟ පෙන්වීමක් සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ගුරු තොරතුරු අඩංගු කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර විෂයයන් අනුව යාවත්කාලීන කළයුතු අතර ගුරු ඇගයීම නිසි පරිදි සිදුකළ යුතුය. |
| (ඉ) | 2024 වාර්ෂික විසර්ජන සබැඳි දර්ශක ඉලක්ක අනුව සෑම වසරකම STMC (විද්‍යාව, | පරීක්ෂා කරන ලද පාසල්වල අනුමත වාර්ෂික සැලසුම්වලට | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නිසි ලෙස |

| | | | |
|---|---|---|---|
| | තාක්ෂණය, ගණිතය සහ වාණිජ්‍යය) සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් පාසල් සැලසුම්කර ක්‍රියාත්මක කළයුතු වුවද, විද්‍යා, වාණිජ්‍ය, තාක්ෂණ සහ තොරතුරු තාක්ෂණ යන විෂයයන් පදනම් කරගනිමින් වියදම් කර තිබුණද, 2024 වර්ෂයේදී නිකවැරටිය සහ මහව කලාප අධ්‍යාපන කාර්යාලවල ගණිතය විෂයයට අදාළ කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි. | අනුව වැඩසටහන් පවත්වා ඇති බව පාසල්වලින් වර්තා වේ. | කළමනාකරණය, අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය කිරීම හා ගැටළු හඳුනාගෙන විසඳුම් ලබාදීම සිදුකළ යුතුය. |
| (ඊ) | 2022 නොවැම්බර් 30 දින සබරගමුව පළාතේ පාසල් 26 ක් සඳහා කලාප අධ්‍යාපන කාර්යාල 03කට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් රු. 3,327,842 ක මුදලක් බැර කරන ලද නමුත් එම මුදල් පාසල් වෙත ලබාදී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නිසි ලෙස කළමනාකරණය, අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය කිරීම හා ගැටළු හඳුනාගෙන විසඳුම් ලබාදීම සිදුකළ යුතුය. |